සැ. යු.-2010.08.13 වැනි දින පළ වූ අංක 1,667 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාලව මුද්‍රණශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,668 - 2010 අගෝස්තු මස 20 වැනි සිකුරාදා - 2010.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1024 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1025 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1449 - B 079895 — 8870 (2010/08)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

සංශෝධනයයි

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

අංක 1,651 හා 2010.04.23 දිනැති ගැසට් පත්‍රයෙහි මවිසින් පල කරන ලද දැන්වීමෙහි ඇතුලත් "ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුව (දොඩන්දූව) කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය" යන්න "ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය'' යනුවෙන් සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

08-402

---

**2009.09.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ග්‍රාම නිලධාරීන් 2009.10.01 දින සිට ග්‍රාම නිලධාරි සේවයේ I වැනි ශ්‍රේණියට උසස් කිරීම**

ග්‍රාම නිලධාරි සේවයට අයත් 2009.10.01 දිනට සේවයේ නියුතු පහත සඳහන් සුදුසුකම් ඇති II වැනි ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත I වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *උසස් කිරීමේ නියමයන්* : පහත අංක 02හි සඳහන් සුදුසුකම් සපුරා ඇති ග්‍රාම නිලධාරීන් මවිසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂණයට ලක්කර, ඔවුන්ගේ කුසලතාවය හා ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගනිමින් ලකුණු ලබාදෙනු ලැබේ. අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි උසස්වීම් පරිපාටියේ කරන ලද සංශෝධනය අනුව සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් 2009.10.01 දින සිට I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

02. *සුදුසුකම්*.-(අ) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වී සිටි කාල සීමාව ද ඇතුළුව 2009.10.01 දිනට ග්‍රාම නිලධාරි සේවයේ II වැනි ශ්‍රේණියේ වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (II වැනි ශ්‍රේණියේ වසර 15ක සේවා කාලයට සමෘද්ධි/ගොවි නියාමක/කෘෂි ව්‍යාප්ති සේවක/විශේෂ සේවා නිලධාරි/වගා නිලධාරි වශයෙන් සේවයේ යෙදී සිට ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන ලද අයකු නම් එම පූර්ව සේවාවේ ස්ථිර සේවා කාලය ද ඇතුළත් වේ. එමෙන්ම දේශපාලන හේතූන් මත 1977 වර්ෂයේදී රැකියාව අහිමිව අංක අමප/97/0419/05/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1995 දී නැවත සේවයේ පිහිටවූ නිලධාරීන්ගේ සේවා කාලය ගණනය කිරීමේ දී 1977 වසරේ මුල් පත්වීම ලද දිනයේ සිට සේවා කාලය ගණන් ගනු ලැබේ.)

(ආ) 2009.10.01 දිනට පෙර ග්‍රාම නිලධාරි II වැනි ශ්‍රේණියේ අවසාන වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම හා එම කාලය තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(ඇ) 2009.10.01 දිනට පෙර ග්‍රාම නිලධාරි සේවයෙහි අනුමත කාර්ය පරිපාටියට අනුකූලව කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්ව සිටීම.

*සටහන*.- II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට යාම, වැටුප් තලය ගැන නොසලකා දස අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන්ගේ සතුටුදායක වැඩ, හැසිරීම, පැමිණීම යන කරුණු පිළිබඳව ඔවුන් සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතිකයක් මත රඳා පවතී.

03. *වැටුප් ක්‍රමය* : (i) ග්‍රාම නිලධාරි I වන ශ්‍රේණිය සඳහා මාසිකව රු. 16,680-09 x 240-10 x 320-රු. 22,040 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv) අනුව)

(ii) උසස්වීම් ලබන නිලධාරීන් ඉහත සඳහන් වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවරෙහි තබනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006හි විධිවිධාන හා එහි පසුව කරන ලද හා ඉදිරියේ දී සිදු කරනු ලබන සංශෝධනවලට ද අනුකූලවය.

04. *උසස් කිරීමේ ක්‍රමය*.- අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට කැඳවා පරීක්ෂණයට ලක් කරනු ලැබේ. එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබේද යන්න හා-

(අ) යහපත් සේවා වාර්තා සඳහා ලකුණු 20ක් ද - නියමිත දිනට වසර 05කට පෙර සතුටුදායක සේවා කාලය හැර ඊට පෙර සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින් හිමි වේ.

(ආ) කීර්ති ප්‍රසංශා ලැබීම් සඳහා ලකුණු 20ක් ද - අනුමත ආකෘතිය මගින් දෙන ලද ප්‍රසංශා සහතික සඳහා ලකුණු 04ක් හා අනෙක් ප්‍රසංශා සහතිකයකට ලකුණු 02 බැගින් හිමි වේ.

(ඇ) නිර්මාණශීලි ක්‍රියාකාරකම් සඳහා ලකුණු 10ක් ද,

(ඈ) ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු 30ක් ද - ජ්‍යෙෂ්ඨත්වය සඳහා වසර 15කට වැඩි සෑම සතුටුදායක සේවා කාලයක් සඳහා වසරකට ලකුණු 02 බැගින් හිමි වේ.

(ඉ) සේවා පලපුරුද්ද පැවරී ඇති රාජකාරී පිළිබඳ අවබෝධය සඳහා ලකුණු 20ක් ද වශයෙන් ලකුණු ලබා දීමක් කරනු ඇත.

(ඊ) මූලික සුදුසුකම් ඇති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන අයට උසස්වීම් 2009.10.01 දින සිට ලබා දෙනු ඇත. 2009.10.01 දිනට නිලධාරියා සේවයේ නොසිටී නම් එම උසස්වීම සඳහා හිමිකම් නොලබනු ඇත.

05. *අයදුම්පත් භාර ගැනීම* :

(i) අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කර එක් පිටපතක් ප්‍රාදේශීය ලේකම් මගින් අදාල දිස්ත්‍රික් ලේකම්වරයාට ලියාපදිංචි

තැපෑලෙන් 2010.09.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ යැවීමටද, අනෙක් පිටපත පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කරවා ගැනීමට ද, කටයුතු කළ යුතු ය.

(ii) දිස්ත්‍රික් ලේකම් විසින් නියමිත දිනට ලැබෙන අයදුම්පත් පිළිබඳ ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කර සති දෙකක් ඇතුළත අමාත්‍යාංශය වෙත එවිය යුතුය. (අයදුම්පත්‍ර එවීම අවශ්‍ය නොවේ.)

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව පමණක් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත්‍ර පිළියෙළ කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් යතුරු ලියනයක ආධාරයෙන් හෝ පරිගණකයක ආධාරයෙන් පිළියෙල කර ගත හැකි නමුදු අයදුම්කරුවන්ගේ තොරතුරු නිවැරදිව, පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය.

(iv) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ ඇමිණිය යුතු නොවේ. එතෙකුදු වුවත් තමන් සඳහන් කරන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි ඉල්ලූ අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව තබා ගත යුතු ය.

(v) මෙම නිවේදනයේ සඳහන් අන්දමට නොලැබෙන සහ අසම්පූර්ණ සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

ඩී. දිසානායක,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ<br>
කටයුතු අමාත්‍යාංශය.

2010 ජූලි මස 29 වැනි දින,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය,<br>
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(A4 කඩදාසියේ දෙපැත්තේ සකස් කරන්න)

*කුසලතාවය මත ග්‍රාම නිලධාරි I වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය*

*I වැනි කොටස*

01. (i) මුලකුරු සමඟ නම :—————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

02. (i) රාජකාරී ලිපිනය :—————.
(ii) පෞද්ගලික ලිපිනය:—————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

04. උපන් දිනය :—————.

05. 2009.10.01 දිනට ග්‍රාම නිලධාරි සේවා කාලය ඃ
අවු. :—————, මාස :—————, දින :—————.

06. රාජ්‍ය සේවයේ පළමු පත්වීමේ දිනය :—————.

07. ග්‍රාම නිලධාරි සේවයට පත්වූ දිනය/අන්තර්ග්‍රහණය කළ දිනය :—————.

08. ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කළ නිලධාරියකු නම් ඒ පිළිබඳ විස්තර :—————.
(අදාල ඡේදය පමණක් සම්පූර්ණ කරන්න)

| | *ඇතුළත්ව සිටි සේවය* | *ඇතුළත් වූ දිනය* | *සේවාකාලය* |
|---|---|---|---|
| (අ) | විශේෂ සේවා නිලධාරි සේවය | ————— | ————— |
| (ආ) | වගා නිලධාරි සේවය | ————— | ————— |
| (ඇ) | කෘෂි ව්‍යාප්ති සේවක සේවය | ————— | ————— |
| (ඈ) | සමෘද්ධි හෝ ගොවි නියාමක සේවය | ————— | ————— |
| (ඉ) | වෙනත් | ————— | ————— |

09. (i) දැනට සේවය කරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම හා අංකය :—————.
(ii) එම ග්‍රාම නිලධාරි කොට්ඨාසය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
(iii) එම ග්‍රාම නිලධාරි කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කය :—————.

10. සේවය කරන ලද දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස (දින වකවානු සහිතව)

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *කාල සීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

11. (i) සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේ ද? :—————.
(ii) එසේ නැත්නම් විස්තර සඳහන් කරන්න. :—————.

12. සංස්ථාවක හෝ වෙනත් සේවාවකට ඔබ මුදා හැර තිබුනේ නම් හෝ දැනට මුදා හැර ඇත්නම් හෝ ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :—————.

13. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් විස්තර දක්වන්න. :—————.

14. සේවා කාලය තුල ක්‍රියාත්මක කරන ලද නිර්මාණාත්මක කටයුතු (කරන ලද වැඩ, ප්‍රදේශයේ සෙත ලැබූ ජනතාව ආදී විස්තර කෙටියෙන් සඳහන් කරන්න.)

15. සේවා කාලය තුළ ලබා ඇති ප්‍රශංසා ආදිය පිළිබඳ විස්තර :—————.

16. ඔබට විරුද්ධව විනය ක්‍රියා මාර්ග ගෙන තිබේද ? :—————.
ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න :—————.

……………… වන මා විසින්, ඉහත සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුව හොත් මෙම සේවාවේ I වැනි ශ්‍රේණියට උසස්වීම පිළිබඳ වූ මගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවෙමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

II වැනි කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතුය

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
.......................................................

(i) ………………මහතා/මහත්මිය/මෙනෙවිය ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව සමඟ සසඳා බලන ලදුව ඒවා නිවැරදි බවත්,

(ii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ නොපැවැත්වෙන බවත්/විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

(iii) පූර්වාසන්න පස් වසර තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවති බවත්, ………… දින සිට ග්‍රාම නිලධාරි II වැනි ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත්, ………… දින සිට කාර්යක්ෂමතා කඩ ඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබ/ නිදහස් කර ඇති බවත්, මෙම අයදුම්පතෙහි පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවෙහි අමුණන ලද බවත් සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්.

නම :————.

පදවි නාමය :————.

නිල මුද්‍රාව :————.

දිනය :————.

08-385

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.